# මාධ්‍ය නිවේදනය

සන්නිවේදන දෙපාර්තමේන්තුව, 30, ජනාධිපති මාවත, කොළඹ 01, ශ්‍රී ලංකාව
+94 11 2477424 / +94 11 2477669 +94 11 2346304
communications@cbsl.lk / dcommunications@cbsl.lk www.cbsl.gov.lk

ශ්‍රී ලංකා මහ බැංකුව
இலங்கை மத்திய வங்கி
CENTRAL BANK OF SRI LANKA

| | |
|---|---|
| නිකුත් කළේ | සන්නිවේදන දෙපාර්තමේන්තුව |
| දිනය | 2026.01.30 |


## කොළඹ පාරිභෝගික මිල දර්ශකය මත පදනම් වූ මතුපිට උද්ධමනය 2026 ජනවාරි මාසයේ දී ඉහළ ගියේය

කොළඹ පාරිභෝගික මිල දර්ශකයෙහි (කො.පා.මි.ද., 2021=100)[1] වාර්ෂික ලක්ෂ්‍යමය වෙනස මගින් මනිනු ලබන මතුපිට උද්ධමනය අඛණ්ඩව මාස තුනක් එකම මට්ටමක පැවතීමෙන් පසුව 2026 ජනවාරි මාසයේ දී ඉහළ ගියේය. ඒ අනුව, වාර්ෂික ලක්ෂ්‍යමය පදනම මත මතුපිට උද්ධමනය, 2025 දෙසැම්බර් මාසයේ දී පැවති සියයට 2.1ට සාපේක්ෂව 2026 ජනවාරි මාසයේ දී සියයට 2.3ක් ලෙස වාර්තා වූ අතර, එය ශ්‍රී ලංකා මහ බැංකුව විසින් සිදු කරන ලද පුරෝකථනයන්ට බොහෝ දුරට අනුකූල විය.

| උද්ධමනය කො.පා.මි.ද., (2021=100) | 2025 දෙසැම්බර් | 2026 ජනවාරි |
|---|---|---|
| දර්ශක අගය | 195.8 | 197.0 |
| මාසික වෙනස (%) | 1.2 | 0.6 |
| වාර්ෂික ලක්ෂ්‍යමය උද්ධමනය (%) | 2.1 | 2.3 |

වාර්ෂික ලක්ෂ්‍යමය පදනම මත, 2025 දෙසැම්බර් මාසයේ දී වාර්තා වූ සියයට 3.0ක ආහාර උද්ධමනය 2026 ජනවාරි මාසයේ දී සියයට 3.3ක් දක්වා වැඩිවීමක් පෙන්නුම් කළේය. ආහාර නොවන උද්ධමනය පෙර මාසයට සාපේක්ෂව 2026 ජනවාරි මාසයේ දී සියයට 1.8හි නොවෙනස්ව පැවතුණි.

කො.පා.මි.ද. (2021=100) මාසික % වෙනස සඳහා දායකත්වය




කො.පා.මි. දර්ශකයෙහි මාසික ලක්ෂ්‍යමය වෙනස මගින් මනිනු ලබන මතුපිට උද්ධමනය, 2026 ජනවාරි මාසයේ දී සියයට 0.59කින් ඉහළ ගියේය. ආහාර කාණ්ඩය මෙම වැඩිවීමට ප්‍රතිශතාංක 0.21කින් දායක වූ අතර, ආහාර නොවන කාණ්ඩය ප්‍රතිශතාංක 0.39ක දායකත්වයක් දැක්විය.

මේ අතර, ආර්ථිකයේ යටිදැරි උද්ධමන ප්‍රවණතා පිළිබිඹු කරන මූලික උද්ධමනය, වාර්ෂික ලක්ෂ්‍යමය පදනම මත 2025 දෙසැම්බර් මාසයේ වාර්තා වූ සියයට 2.7හි සිට 2026 ජනවාරි මාසයේ දී සියයට 2.3 දක්වා පහළ ගියේය.

සුදුසු ප්‍රතිපත්තිමය ක්‍රියාමාර්ගවල සහාය ඇතිව, 2026 වසරේ දෙවන භාගය වන විට උද්ධමනය සියයට 5ක ඉලක්කය කරා ක්‍රමයෙන් ඉහළ යනු ඇති බව 2026 ජනවාරි මස මුදල් ප්‍රතිපත්ති වාරයේ දී සිදු කළ උද්ධමන පුරෝකථන මගින් පෙන්නුම් කෙරේ.

**මතුපිට උද්ධමනයේ පුරෝකථන(අ)**
**කොළඹ පාරිභෝගික මිල දර්ශකය,(ආ) කාර්තුමය සාමාන්‍යය, වාර්ෂික ලක්ෂ්‍යමය**
**2026 ජනවාරි මස මුදල් ප්‍රතිපත්ති වාරයේ පුරෝකථන මත පදනම්ව**




(අ) මෙහි පෙන්වා දී ඇති උද්ධමන ව්‍යාප්ති සටහනෙහි දක්වා ඇති පුරෝකථන මගින් 2026 වසරේ ජනවාරි මාසයේ පුරෝකථන වාරයේ දී පැවති දත්ත, උපකල්පන හා විනිශ්චයන් පිළිබිඹු කෙරේ. උද්ධමන ව්‍යාප්ති සටහන (Fan chart) මගින් මූලික පුරෝකථන පථය වටා පවතින අවිනිශ්චිතතාව ක්‍රමයෙන් වර්ණය අඩු වන පරිදි වූ විශ්‍රම්භ පරාස භාවිත කිරීමෙන් විදහා දැක්වේ.

(ආ) උද්ධමන ව්‍යාප්ති සටහනෙහි වාර්තා කරන ලද දත්ත කොළඹ පාරිභෝගික මිල දර්ශකය (2021=100, සෘතුමය වශයෙන් ඇතිවන බලපෑම් ඉවත් කරන ලද) මත පදනම් වේ. එම සියලුම ප්‍රකාශිත දත්ත මත පුරෝකථන පදනම් වේ.

*§ 2023 වසරේ ඔක්තෝබර් මාසයේ දී මහ බැංකුව සහ මුදල් අමාත්‍යවරයා අතර අත්සන් කරන ලද මුදල් ප්‍රතිපත්ති රාමු ගිවිසුම යටතේ උද්ධමන ඉලක්කය (5%) සඳහා එකඟ වී ඇත.*

*මූලය: ශ්‍රී ලංකා මහ බැංකු කාර්යමණ්ඩල පුරෝකථන*

[1] කොළඹ පාරිභෝගික මිල දර්ශකය (කො.පා.මි.ද., 2021=100), ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව විසින් සම්පාදනය කරනු ලබන අතර එමගින් කොළඹ දිස්ත්‍රික්කයේ නාගරික ප්‍රදේශවල කුටුම්බ විසින් මිලදී ගන්නා භාණ්ඩ හා සේවාවල මිලෙහි සාමාන්‍ය වෙනස්වීම් පෙන්නුම් කරනු ලබයි.

## උප කාණ්ඩ අනුව කො.පා.මි.ද. (2021=100) මත පදනම් වූ මතුපිට උද්ධමනය
## (වාර්ෂික ලක්ෂ්‍යමය % වෙනස)




## කොළඹ පාරිභෝගික මිල දර්ශකයෙහි (2021=100) හැසිරීම

| කාලපරිච්ඡේදය | | දර්ශක අගය | | මාසික % වෙනස | | වාර්ෂික ලක්ෂ්‍යමය % වෙනස | | වාර්ෂික සාමාන්‍ය % වෙනස | |
|---|---|---|---|---|---|---|---|---|---|
| වසර | මාසය | කො.පා.මි.ද. | කො.පා.මි.ද. (මූලික) | කො.පා.මි.ද. | කො.පා.මි.ද. (මූලික) | කො.පා.මි.ද. | කො.පා.මි.ද. (මූලික) | කො.පා.මි.ද. | කො.පා.මි.ද. (මූලික) |
| 2025 | ජනවාරි | 192.6 | 178.4 | 0.5 | 0.7 | -4.0 | 1.2 | 0.4 | 3.2 |
| | පෙබරවාරි | 192.2 | 178.5 | -0.2 | 0.1 | -4.2 | 0.7 | -0.5 | 3.0 |
| | මාර්තු | 191.6 | 178.6 | -0.3 | 0.1 | -2.6 | 0.7 | -0.8 | 2.8 |
| | අප්‍රේල් | 191.2 | 178.8 | -0.2 | 0.1 | -2.0 | 0.8 | -1.1 | 2.6 |
| | මැයි | 192.8 | 179.2 | 0.8 | 0.2 | -0.7 | 1.2 | -1.2 | 2.4 |
| | ජූනි | 194.5 | 180.1 | 0.9 | 0.5 | -0.6 | 1.5 | -1.4 | 2.1 |
| | ජූලි | 194.1 | 180.8 | -0.2 | 0.4 | -0.3 | 1.6 | -1.6 | 1.9 |
| | අගෝස්තු | 193.3 | 180.9 | -0.4 | 0.1 | 1.2 | 2.0 | -1.5 | 1.8 |
| | සැප්තැම්බර් | 193.7 | 181.2 | 0.2 | 0.2 | 1.5 | 2.0 | -1.4 | 1.7 |
| | ඔක්තෝබර් | 193.8 | 181.4 | 0.1 | 0.1 | 2.1 | 2.2 | -1.2 | 1.6 |
| | නොවැම්බර් | 193.4 | 181.3 | -0.2 | -0.1 | 2.1 | 2.4 | -0.8 | 1.6 |
| | දෙසැම්බර් | 195.8 | 181.8 | 1.2 | 0.3 | 2.1 | 2.7 | -0.5 | 1.6 |
| 2026 | ජනවාරි | 197.0 | 182.5 | 0.6 | 0.4 | 2.3 | 2.3 | 0.0 | 1.7 |

මූලය: ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව

සටහන: ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුවට අනුව වාර්ෂික ලක්ෂ්‍යමය උද්ධමනය සහ මාසික වෙනස, වටයන ලද දර්ශකාංක භාවිතා කර ගණනය කර ඇත.